# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූලි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.45 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 70/78

**මහ නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

## I වන කොටස

2. පහත දක්වෙන අලුත් වගන්තිය (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ නගර සභා ආඥාපනතේ 136 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 136අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 252 වන අධිකාරයෙහි 136අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"කර්මාන්ත ශාලාවලින් සිදු වන පරිසර දූෂණය.

136අ. (1) යම් තැනැත්තකු විසින්, කොළඹ මහ නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි යම් කර්මාන්ත ශාලාවක්, එහි අවට පරිසරයේ සෞඛ්‍ය තත්වයට අන්තරායක් නැතහොත් හානියක් සිදු වන පරිද්දෙන් පවත්වාගෙන යනු ලැබුවහොත් හෝ එසේ පවත්වාගෙන යාමට සැලැස්වුව හොත්, ඒ තැනැත්තා වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරද කරු වන්නේ ය.

(2) ලඝු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කර්මාන්ත ශාලාවෙන් සිදු වූ පරිසර දූෂණයේ ප්‍රමාණය අනුව—

(අ) මේ ආඥාපනතේ විධිවිධාන නැතහොත් මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ඒ කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය වෙනුවෙන් නිකුත් කරන ලද බලපත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක දඩයක් ගෙවන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට ආඥා කළ යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා යට කී දඩය වැඩි වුව ද ඒ නොතකා එකී දඩය නියම කළ යුතු ය. තවද එසේ අය කර ගනු ලබන දඩ මුදල සභාවේ අරමුදලට ගෙවිය යුතු ය ; එසේ නැතහොත්

(ආ) ඒ කර්මාන්ත ශාලාව පවත්වා ගෙන යාම නතර කරන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "පරිසර දූෂණය" යන්නෙන්, පරිසරයෙන් ලැබෙන ප්‍රයෝජන කිසිවක් කෙරෙහි අහිතකර ලෙස බලපාන අන්දමට නැත හොත්, මහජනයාගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ ශුභ සිද්ධියට හෝ සතුන්ට, පක්ෂීන්ට, වන සතුන්ට, මත්ස්‍යයන්ට, ජලජ ජීවීන්ට හෝ ශාක වලට උපද්‍රව සහිත තත්වයක් නැතහොත් උපද්‍රව කාරි විය හැකි තත්වයක් ඇති වන අන්දමට, අප ද්‍රව්‍ය පිට කිරීමෙන්, විමෝචනය කිරීමෙන් නැත හොත් තැන්පත් කිරීමෙන්, පරිසරයේ කවර වූ හෝ කොටසක පවත්නා භෞතික, තාප, රසායනික, ජෛව හෝ විකිරණශිලී ගුණ කිසිවක් කෙළින් ම නැතහොත් අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 230 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 230 වන වගන්තියේ (2) වන උපවගන්ති යට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් වාර්ෂික වරිපනම් බදු මුදලක් ඒ වර්ෂයේ ජනවාරි මාසයේ තිස් එක් වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබුවහොත් ඒ බදු මුදලින් සියයට දහයක වට්ටමක් අඩු කිරීමට සෑම මහ නගර සභාවක් විසින් ම අවසර දිය යුතු ය; එසේ නැතහොත් ඒ වරිපනම් බදු මුදල කොටස් වශයෙන් ගෙවිය යුතු වන අවස්ථාවක, එසේ ගෙවිය යුතු වරිපනම් බදු මුදලෙහි කොටස, ඒ වරිපනම් බදු මුදල ගෙවනු ලැබිය යුතුව ඇත්තේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාවේ පළමුවන මාසය ඇතුළත දී ගෙවනු ලැබුවහොත් ඒ වරිපනම් බදු මුදලෙහි කොටසින් සියයට පහක වට්ටමක් අඩු කිරීමට මහ නගර සභාවක් විසින් අවසර දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 245 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 245 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරි මෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) හතරවන උපලේඛනයේ දැක්වෙන්නා වූ ද තම මහ නගර සභා ප්‍රදේශය තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ ද සියලු වාහන සහ සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයක වාර්ෂික බද්දක් සෑම මහ නගර සභාවක් ම විසින් අය කළ හැකි ය.".

247අ, 247ආ, 247ඇ, 247ඈ සහ 247ඉ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 247 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 247අ, 247ආ, 247ඇ, 247ඈ සහ 247ඉ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ඇතැම් බලපත්‍ර ගාස්තු අයකිරීමට සභාව සතු බලය.

247අ. (1) මහ නගර සභාවක් විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් ගාස්තුවක් ඒ සභාව විසින් නියමකොට අය කර ගත හැකි ය.

(2) මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක හෝ විස්තර කර ඇති කාර්ය සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙමින් සභාව විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන ගාස්තුව, එසේ බලපත්‍ර දෙනු ලැබූ ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව සභාව විසින් නිශ්චය කළ යුතු ය:

එසේ වුව ද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයක් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය වෙනුවෙන් අය කළ යුතු උපරිම බලපත්‍ර ගාස්තුව II වන තීරයේ ඊට අනුරූප සටහනේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය:

| I වන තීරය | | II වන තීරය |
|---|---|---|
| වාර්ෂික වටිනාකම— | | රු. |
| රු. 1,500 නොඉක්මවන විට | ... | 2,000 |
| රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට | ... | 3,000 |
| රු. 2,500 ඉක්මවන විට | ... | 5,000 |

එසේ ම තවරදුටත් ඒ ස්ථානය, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද අවස්ථාවක ඉහත සඳහන් පරිදි අය කළ යුතු බලපත්‍ර ගාස්තුව, ඒ බලපත්‍ර ගාස්තුව අය කරනු ලබන්නේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය සඳහා ඒ හෝටලයෙහි, ආපන ශාලාවෙහි නැතහොත් නවාතැන් පොළෙහි ලැබීම්වලට අනුකූලව විය යුතු අතර, ඒ බලපත්‍ර ගාස්තුව එම ලැබීම්වලින් සියයට එක නොඉක්ම විය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා හෝටලයකට, ආපන ශාලාවකට නැතහොත් නවාතැන් පොළකට අදාළව යෙදී ඇති විට, "ලැබීම්" යන්නෙන් ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් හෝ ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ පවත්වා ගෙන යාමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු නැතහොත් ලැබීමට ඇති මුළු මුදල අදහස් වේ.

ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු නියම කිරීම.

247ආ. (1) යම් මහ නගර සභාවක පාලන සීමා තුළ කර ගෙන යන යම් කර්මාන්තයක් වෙනුවෙන් බද්දක් නියමකොට අය කිරීම ඒ මහ නගර සභාව විසින් කළ හැකි ය.

(2) එසේ (1) වන උපවගන්තිය යටතේ අය කරනු ලබන බද්ද, ඒ කර්මාන්තය කර ගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව ඒ සභාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක වාර්ෂික බද්දක් විය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයක් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය වෙනුවෙන් අය කළ යුතු බද්ද II වන තීරයේ ඊට අනුරූප සටහනේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය:

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම— | රු. |
| රු. 1,500 නොඉක්මවන විට ... | 2,000 |
| රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට ... | 3,000 |
| රු. 2,500 ඉක්මවන විට ... | 5,000 |

එසේ ම තවදුරටත්, යම් කර්මාන්තයක් වෙනුවෙන් මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම්, එවැනි කර්මාන්තයක් වෙනුවෙන් ඉහත සඳහන් බද්ද නියම කිරීම හෝ අය කිරීම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අය කරනු ලබන බද්ද, සභාව විසින් නිශ්චය කරනු ලබන දිනයක දී හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති දිනයක දී හෝ ඒ කර්මාන්තය කරගෙන යන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත්වීමෙන් පසු දින හතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා ඒ මුදල වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර විෂයෙහි බදු නියම කිරීම.

247ඈ. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ බලපත්‍රයක් අවශ්‍ය නොවන යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැත හොත් 247ආ වගන්තිය යටතේ යම් බද්දක් ගෙවිය යුතු යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ යම් මහ නගර සභාවක පාලන සීමා තුළ යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලබන අවස්ථාවක දී, ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් ඒ තැනැත්තා විෂයෙහි වාර්ෂික බද්දක් නියම කළ හැකි ය. ඒ බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් ම වූ වර්ෂයේ දී ඒ වෙළෙඳ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් අනුව ඒ බද්ද නියම කළ යුතු අතර, ඒ බද්ද මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්ම විය යුතු ය :

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වෙළඳ ව්‍යාපාරයෙන් ගත වූ වර්ෂයේ දී ලත් ලැබීම්— | ගෙවිය යුතු බද්ද රු. |
| (i) රු. 6,000 නොඉක්මවන විට | නැත |
| (ii) රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට ... ... | 90 |
| (iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට ... ... | 180 |
| (iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට ... ... | 360 |
| (v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට ... ... | 1,200 |
| (vi) රු. 1,50,000 ඉක්මවන විට ... | 3,000 |

එසේ වුවද, ස්ථිර ස්ථානයක තම වෙළෙඳ ව්‍යාපාරය පවත්වාගෙන නොයන්නා වූ හෝ තම ව්‍යාපාරයේ කටයුතු සඳහා පොදු මාර්ගවල නැත හොත් පොදු ස්ථානවල ස්ථාපනය නොවන්නා වූ හෝ චාරික වෙළෙඳුන්ට මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද සභාව විසින් නියම කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කර ඇති හෝ දිනයක දී ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා

සිටි දිනය ඉකුත්වීමෙන් පසු දින සතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අයකර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා—

(අ) "වෙළෙඳ ව්‍යාපාරය" යන්නට, යම් කර්මාන්තයක් හෝ වෘත්තියක් හෝ ජීවනෝපායක් හෝ යම් නිෂ්පාදකයකුගේ හෝ තමා කරන යම් ගනුදෙනුවක් නැතහොත් සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් නැතහොත් ගාස්තුවක් අයකරන යම් තැනැත්තකුගේ හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් ද ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරයක් ද ඇතුළත් වන නමුත්, පෞද්ගලික පොළක දී භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය විකිණීමේ රක්ෂාව හෝ, රජයෙන් ආධාර දීමනා ගෙවනු ලබන්නා වූ නැතහොත් කලින් එවැනි ආධාර දීමනා ගෙවනු ලැබුවා වූ ද දැනට එවැනි ආධාර දීමනා ගෙවනු නො ලබන්නා වූ ද යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වාගෙන යාමේ රක්ෂාවක් ඊට ඇතුළත් නොවේ; තවද

(ආ) "ලැබීම්" යන්න යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් නැතහොත් ඒ ව්‍යාපාරය කරගෙන යාමේ දී ඉටු කරනු ලබන සේවාවලින් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ මුළු මුදල ප්‍රමාණය අදහස් වන අතර, පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ද ඊට ඇතුළත් වේ:—

(අ) මුදල් සපයන්නකු, මුදල් ණයට දෙන්නකු නැතහොත් උකස් බඩු ගන්නකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ණයට දෙන ලද මුදල්. ඒ ණය සම්බන්ධයෙන් ඔහු ලබා ගත් නැතහොත් ඔහුට ලැබීමට ඇති පොලිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු නැතහොත් වෙනත් අයකිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල් ප්‍රමාණ ;

(ආ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වන විට සහ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත් ව, බ්‍රෝකර් කෙනකු නැතහොත් කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන විට—

(i) ඔහු විසින් විකුණන ලද ඉඩමක් නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද ඉඩමක් සම්බන්ධයෙන් වන විට ඒ විකිණීමට අදාළ ව ඔහු විසින් කරන ලද ගනුදෙනු නැතහොත් ඔහු ඉටු කළ යම් සේවාවක් සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබීමට ඇති හෝ කොමිස් මුදල් නැතහොත් ගාස්තු ;

(ii) ඔහු විසින් විකුණන ලද නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද යම් බඩු සම්බන්ධයෙන් වන විට, ඒ බඩු මිලදී ගත් තැනැත්තා විසින් ඒ බඩු සඳහා ගෙවන ලද හෝ ගෙවීමට ඇති හෝ මුළු මුදල ;

(ඇ) (කොටස් බ්‍රෝකර්කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනකු නොවන) යම් බ්‍රෝකර්කෙනකු හෝ කොමිස් නියෝජිතයකු හෝ සම්බන්ධයෙන් වන විට, ඔහු—

(i) ශ්‍රී ලංකාවේ පදිංචිව නොසිටින යම් තැනැත්තකුගේ බඩු ඒ තැනැත්තා වෙනුවෙන් විකුණන්නේ නම් හෝ විකිණීමේ මූලිකත්වය දරන්නේ නම්, හෝ

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බඩු කිසිවක් සම්බන්ධයෙන් යම් අපනයනකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ව්‍යාපාර කරගෙන යන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ තැනැත්තාගේ බඩු කිසිවක් ශ්‍රී ලංකාවේ දී විකිණීමට මූලික වන්නේ නම් සහ ඒ බඩු විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල එකී වෙනත් තැනැත්තාගේ වෙළෙඳ ව්‍යාපාරයේ ලැබීම්වලට ඇතුළත් වන්නේ නම්,

එවැනි විකිණීමක දී, එවැනි ක්‍රියා කිරීමක දී නැතහොත් එවැනි විකිණීමකට මූලිකවීමක දී ඒ බ්‍රෝකර් තැන හෝ කොමිස් නියෝජිතයා විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඔහු විසින් ඉටු කරන ලද යම් සේවයක් සම්බන්ධයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද නැත හොත් ඔහුට ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු ද, කොටස් බ්‍රෝකර්කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර්කෙනකු හෝ සම්බන්ධ යෙන් වන විට, ඒ බ්‍රෝකර් හෝ කොමිස් නියෝජිතයා හෝ විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැත හොත් ඉටු කරන ලද යම් සේවයක් වෙනුවෙන් ඒ බ්‍රෝකර්ට හෝ කොමිස් නියෝජිතයාට ලැබුණු නැතහොත් ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු; සහ

(ඈ) යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වා ගෙන යන යම් තැනැත්තකු සම්බන්ධ යෙන් වන විට, ඒ අධ්‍යාපන ආය තනය හෝ පාඨශාලාව හෝ සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු ලාභ අතහැර, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ පවත්වා ගෙන යාමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස්

වන නමුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ.

සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අයකිරීම.

247ඈ. (1) මහ නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ, ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක,—

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය, නියමිත අනුපාතයට වඩා අඩු නම්, හෝ

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කැරෙන ගොවිතැනකට ඒ ඉඩම යොදවා නැත් නම්,

ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක් නොඉක්මවන ප්‍රමාණයක බද්දක් ඒ සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරු විෂයෙහි වාර්ෂිකව නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉඩමක භූමියේ ප්‍රාග්ධන අගය තක්සේරු කරන සෑම අවස්ථාවක දී ම, ප්‍රධාන ප්‍රඥප්තියේ 235 වන සහ 236 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට අදාළ කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා “ භූමියේ ප්‍රාග්ධන අගය ” යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩමේ ඇති ගොඩනැගිලි සියල්ල ම අතහැර හා උකස්කර, බදුකර, අවහිර හෝ වෙනත් බැඳීම් සියල්ලෙන් තොරව ඒ ඉඩම පමණක් විවෘත වෙළෙඳ පොළෙහි දී විකුණනු ලැබුවහොත් ඒ ඉඩම සඳහා ගෙවනු ලැබිය හැකි මිල ගණන ඉන් අදහස් වේ.

ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම.

247ඉ. (1) මහ නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක්, ඒ විකුණුම් කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ

සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම විකුණා ලත් මුදලින්, ඒ සභාවට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත්වීමෙන් පසු දින දහහතරක් තුළ දී ඒ බද්ද නොගෙවනු ලැබුවහොත්, ඒ පැහැර හැරීම, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. අය විය යුතු මුදල් ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 255 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 255 වන වගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) බලපත්‍රයක් නිකුත් කිරීමේ වියදම සඳහා—

(i) ගෙවනු ලැබිය යුතු බද්දෙහි හෝ කුලියෙහි ප්‍රමාණයෙන් සියයට දහයක;

(ii) මුඩු ඉඩම් සහ වාසස්ථාන වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහළොවක; සහ

(iii) මුඩු ඉඩම් සහ වාසස්ථාන නොවන දේපළ වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට විස්සක

අය කිරීමක් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 272 වන වගන්තියේ (30) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(30අ) මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු වන යම් බද්දක් සම්බන්ධයෙන් හෝ යම් බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ අවශ්‍ය වන සියලු වාර වාර්තා සහ තොරතුරු සැපයීම ඇතුළුව, බදු නියම කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 305 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 305 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි, "මේ ආඥාපනතේ විස්තර කර ඇති" යන වචනවල සිට "යම් බලපත්‍රයක් ප්‍රදානය කර ඇති අවස්ථාවක දී සහ යම් තාවකාලික ඉදිකිරීමක්" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට "යම් තාවකාලික ඉදිකිරීමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි 3 වන ඡේදයේ (ඇ) කරුණට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කරුණ ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) බඩු උකස්ගන්නන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර වෙනුවෙන් බඩු උකස්ගන්නන් විසින් ;"; සහ

(2) එහි 3 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"3අ. මහ නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමකට අදාළව කරන ලද පැවරීම්, උකස්, බැදුම් කර, තෑගි කිරීම් සහ බදුකර වෙනුවෙන් මුද්දර ආඥාපනත යටතේ ගෙවන ලද සියලු මුද්දර ගාස්තු.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"(245 වන වගන්තිය) හතර වන උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා ... | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා— | |
| | රු. ශ. |
| (අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 10.00 |
| (ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5.00 |
| සෑම කරත්තයක් ම සඳහා ... | 20.00 |
| සෑම අත් කරත්තයක් ම සඳහා ... | 10.00 |
| සෑම රික්ෂෝවක් ම සඳහා ... | 7.50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා ... ... | 15.00 |
| සෑම අලියකු ම සඳහා ... ... | 50.00 |

රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරක්ක, හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා භාවිත කැරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිත නොකැරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට, යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව, විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද, යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ, ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.".

## II වන කොටස

255 වන අධිකාරයේ 157 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** (මෙම කොටසෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නගර සභා ආඥාපනතේ 157 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එහි (3) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) මේ ආඥාපනත යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන සියලු වාර වාර්තා සහ තොරතුරු සැපයීම.";

(ii) එහි (8) වන ඡේදයේ (ඉ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉ) අලුත් ගොඩනැගිලි ඉදිකිරීම හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම හෝ සඳහා වූ සැලැස්මවල් පරීක්ෂා කිරීම හා සලකා බැලීම සඳහා ගාස්තු අය කිරීම; සහ

(iii) එහි (9) වන ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) ස්වයංක්‍රිය ව හෝ යාන්ත්‍රික ව හෝ ශබ්දය ජනනය කරන නැතහොත් ප්‍රතිජනනය කරන ග්‍රැමෆෝන් යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, ඇම්ප්ලිෆයර් යන්ත්‍ර සහ වෙනත් උපකරණ ක්‍රියා කරවීම විධිමත් කිරීම හා පාලනය කිරීම ඇතුළුව කරදර නැවැත්වීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් වාර්ෂික වරිපනම් බදු මුදලක් ඒ වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින හෝ එදිනට පෙර ගෙවනු ලැබුවහොත් එම වාර්ෂික වරිපනම් බදු මුදලින් සියයට දහයක වට්ටමක් අඩු කිරීමට ද ඒ වරිපනම් බදු මුදල කොටස් වශයෙන් ගෙවිය යුතු විටක එකී වරිපනම් කොටස් මුදල ගෙවිය යුතු වනුයේ යම් කාලසීමාවක් වෙනුවෙන් ද ඒ කාලසීමාවේ පළමුවන මාසය ඇතුළත එය ගෙවනු ලැබුවහොත් එකී වරිපනම් බදු කොටස් මුදලින් සියයට පහක වට්ටමක් අඩු කිරීමට ද සභාව විසින් අවසර දිය යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) වාහන හා සතුන් සම්බන්ධයෙන් 162 වන වගන්තිය යටතේ නියම කිරීමට නගර සභාවකට බලය දී ඇති බද්ද, ඒ නගර සභාව පිහිටුවා ඇති නගරය තුළ සාමාන්‍ය යෙන් භාවිත කරනු ලබන්නා වූ හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන්නා වූ ද තුන් වන උපලේඛනයේ විස්තර කර ඇත්තා වූ ද වාහන හා සතුන් සියල්ල නැතහොත් ඉන් යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ වාර්ෂික බද්දක් විය යුතු අතර, ඒ බදු ප්‍රමාණය ඒ උපලේඛනයේ පිළිවෙළින් දක්වා ඇති බදු ප්‍රමාණ විය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තියේ (2) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) බලපත්‍ර ගාස්තු ප්‍රමාණය, බලපත්‍ර ලබාගත යුතු වන්නේ යම් ස්ථානයක් සඳහා ද ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන, යම් ගාස්තු ප්‍රමාණයක් විය යුතු ය:

එසේ වුව ද එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම පහත දැක්වෙන I වන තීරයේ සඳහන් යම් කරුණක සීමාව තුළට වැටෙන්නේ නම්, ඒ සඳහා අය කළ හැකි උපරිම බලපත්‍ර ගාස්තුව II වන තීරයේ ඊට අනුරූපව දක්වා ඇති මුදල් ප්‍රමාණය නොඉක්ම විය යුතු ය:—

| I වන තීරය | | II වන තීරය |
|---|---|---|
| වාර්ෂික වටිනාකම— | | රු. ශ. |
| රු. 750 නොඉක්මවන විට | ... | 500.00 |
| රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට | ... | 750.00 |
| රු. 1,500 ඉක්මවන විට | ... | 1000.00 |

එසේම තවදුරටත්, ඒ ස්ථානය, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන් පොළ (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක එසේ අය කළ යුතු බලපත්‍ර ගාස්තුව, බලපත්‍ර ගාස්තුව අය කරනු ලැබූ වර්ෂ

යට පෙරාතුවම වූ වර්ෂය සඳහා එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොළේ ලැබීම්වලට අනුකූලව විය යුතු අතර එය ඒ ලැබීම්වලින් සියයට එකක් නොඉක්ම විය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා හෝටලයකට, ආපන ශාලාවකට නැතහොත් නවාතැන් පොළකට අදාළව යෙදී ඇතිවිට, " ලැබීම් " යනනෙන් ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් හෝ ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ පවත්වා ගෙන යාමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු නැතහොත් ලැබීමට ඇති මුළු මුදල අදහස් වේ. ".

165 අ, 165 ආ, 165 ඇ සහ 165 ඈ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 165 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 165අ, 165ආ, 165ඇ සහ 165ඈ වගන්ති වශයෙන් බලපැවැත් විය යුතු ය :—

" ඇතැම් කර්මාන්ත විෂයයෙහි බදු නියම කිරීම.

165අ. (1) යම් නගර සභාවක පාලන සීමා තුළ කර ගෙන යන යම් කර්මාන්තයක් විෂයෙහි බද්දක් නියම කොට අය කිරීම ඒ නගර සභාව විසින් කළ හැකි ය.

(2) එසේ (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන බද්ද, ඒ කර්මාන්තය කර ගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුකූල ව ඒ සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක වාර්ෂික බද්දක් විය යුතු ය :

එසේ වුව ද එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුළත් යම් ප්‍රමාණයක් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය සම්බන්ධයෙන් අය කළ යුතු බද්ද II වන තීරයේ ඊට අනුරූප සටහනේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්ම විය යුතු ය :—

| I වන තීරය | | II වන තීරය |
|---|---|---|
| වාර්ෂික වටිනාකම— | | රු. ශ. |
| රු. 750 නොඉක්මවන විට | ... | 500.00 |
| රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට | ... | 750.00 |
| රු. 1,500 ඉක්මවන විට | ... | 1,000.00 |

එසේ ම තවදුරටත්, යම් කර්මාන්තයක් සඳහා, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම්, එවැනි කර්මාන්තයක් සඳහා ඉහත සඳහන් බද්ද නියම කිරීම හෝ අය කිරීම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද බද්ද, සභාව විසින් තීරණය කරනු ලබන දිනයක දී හෝ අතුරු ව්‍යවස්ථා මගින්, නියම කර ඇති දිනයක දී හෝ, ඒ කර්මාන්තය කරගෙන යන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියම කරන ලද යම් බද්දක් ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත්වීමෙන් පසු දින හතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණයට වඩා ඒ මුදල වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අයකර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර විෂයයෙහි බදු නියම කිරීම.

165ආ. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ බලපත්‍රයක් අවශ්‍ය නොවන නැතහොත් 165අ වගන්තිය යටතේ යම් බද්දක් ගෙවිය යුතු යම් වෙළෙඳ ව්‍යාපාරයක් යම් නගර සභාවක පාලන සීමා තුළ කර ගෙන යන සෑම තැනැත්තකු ම විෂයෙහි වාර්ෂික බද්දක්, ඒ බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින්ම වූ වර්ෂයේ දී ඒ ව්‍යාපාරයේ ලැබීම් වලට අනුකූලව හා පහත දැක්වෙන ප්‍රමාණ නොඉක්මවා, ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මගින්, නියම කොට අය කළ හැකි ය :—

| I වන තීරය | II වන තීරය<br>ගෙවිය යුතු බද්ද |
|---|---|
| ව්‍යාපාරයෙන් වර්ෂයක ලැබීම්— | රු. ශ. |
| (i) රු. 6,000 නොඉක්මවන විට | නැත |
| (ii) රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට ... ... | 90.00 |

(iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට ... .... 180.00

(iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට ... ... 360.00

(v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට ... ... 1,200.00

(vi) රු. 1,50,000 ඉක්මවන විට ... 3,000.00

එසේ වුව ද ස්ථිර ස්ථානයක තම වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන නොයන්නා වූ හෝ තම ව්‍යාපාරයේ කටයුතු සඳහා පොදු මාර්ගවල නැත හොත් පොදු ස්ථානවල ස්ථාපනය නොවන්නා වූ හෝ චාරිකා වෙළෙඳුන්ට මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද සභාව විසින් නියම කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කර ඇති හෝ දිනයක දී ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නියම කරන ලද යම් බද්දක් යම් දිනයක දී ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින හතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ පැහැර හැරීම ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණයට වඩා එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර එසේ අයකර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "වෙළෙඳ ව්‍යාපාරය" යන්නට, යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ජීවනෝපායක් හෝ නිෂ්පාදකයකු

ගේ හෝ තමා කරන යම් ගනුදෙනුවක් නැතහොත් සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් නැතහොත් ගාස්තුවක් අය කරන යම් තැනැත්තකුගේ ව්‍යාපාර යෙන් හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරු වකුගේ ව්‍යාපාරය ද ඇතුළත් වන නමුත් පෞද්ගලික පොළක දී භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය විකිණීමේ රක්ෂාව හෝ රජයෙන් ආධාර දීමනා ගෙවනු ලබන්නා වූ නැත හොත් කලින් එවැනි ආධාර දීමනා ගෙවනු ලැබුවා වූ ද දැනට එවැනි ආධාර දීමනා ගෙවනු නොලබන්නා වූ ද අධ්‍යා පන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වා ගෙන යාමේ රක්ෂාව ඊට ඇතුළත් නොවේ ; තව ද

(ආ) "ලැබීම්" යන්න යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනු දෙනුවලින් නැතහොත් ඒ ව්‍යාපාරය කරගෙන යාමේ දී ඉටු කරනු ලබන සේවාවලින් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ මුළු මුදල් ප්‍රමාණය අදහස් වන අතර, පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ද ඊට ඇතුළත් වේ :—

(අ) මුදල් සපයන්නකු, මුදල් ණයට දෙන්නකු නැතහොත් උකස් බඩු ගන්නකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ණයට දෙන ලද මුදල්, ඒ ණය සම්බන්ධයෙන් ඔහු ලබා ගත් නැතහොත් ඔහුට ලැබීමට ඇති පොලිය සහ ඒ ණය සම්බන්ධ යෙන් ගාස්තු නැතහොත් වෙනත් අයකිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල් ප්‍රමාණ ;

(ආ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වන විට සහ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත් ව බ්‍රෝකර් කෙනකු නැතහොත් කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන විට—

(i) ඔහු විසින් විකුණන ලද ඉඩ මක් නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද ඉඩමක් සම්බන්ධයෙන් වන විට, ඒ විකිණීමට අදාළව ඔහු විසින් කරන

ලද ගනු දෙනු නැතහොත් ඔහු ඉටු කළ සේවා කිසි වක් සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබීමට ඇති හෝ කොමිස් මුදල් නැත හොත් ගාස්තු ;

(ii) ඔහු විසින් විකුණන ලද නැත හොත් ඔහුගේ මූලිකත්ව යෙන් විකුණන ලද බඩු කිසිවක් සම්බන්ධයෙන් වන විට, ඒ බඩු මිල දී ගත් තැනැත්තා විසින් ඒ බඩු සඳහා ගෙවන ලද හෝ ගෙවීමට ඇති හෝ මුළු මුදල ;

(ඇ) (කොටස් බ්‍රෝකර්කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර්කෙනකු නොවන) යම් බ්‍රෝකර්කෙනකු හෝ කොමිස් නියෝජිතයකු හෝ සම්බන්ධයෙන් වන විට, ඔහු—

(i) ශ්‍රී ලංකාවේ පදිංචිව නොසිටින යම් තැනැත්තකුගේ බඩු ඒ තැනැත්තා සඳහා විකුණන්නේ නම් හෝ විකිණීමේ මූලිකත්වය දරන්නේ නම්, හෝ

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බඩු කිසිවක් සම්බන්ධයෙන් යම් අපනයනකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ව්‍යාපාරයක් කර ගෙන යන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ තැනැත්තාගේ බඩු කිසිවක් ශ්‍රී ලංකාවේ දී විකිණීමට මූලික වන්නේ නම් සහ ඒ බඩු විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල එකී වෙනත් තැනැත්තාගේ වෙළෙඳ ව්‍යාපාරයේ ලැබීම්වලට ඇතුළත් වන්නේ නම්

එවැනි විකිණීමක දී, එසේ ක්‍රියා කිරීමක දී නැතහොත් එවැනි විකිණීමකට මූලිකවීමක දී ඒ බ්‍රෝකර් නැන හෝ කොමිස් නියෝජිතයා විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඔහු විසින් ඉටු කරන ලද යම් සේවයක් සම්බන්ධයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද නැතහොත් ඔහුට ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු ද, කොටස් බ්‍රෝකර් කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනකු සම්බන්ධයෙන් වන විට ඒ බ්‍රෝකර් හෝ කොමිස් නියෝජිතයා හෝ විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඉටු කරන ලද යම් සේවයක් සඳහා ඒ බ්‍රෝකර්ට හෝ කොමිස් නියෝජිතයාට ලැබුණු නැතහොත් ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු; සහ

(ඈ) යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වා ගෙන යන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු ලාභ අත හැර, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ පවත්වා ගෙන යාමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස් වන නමුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ.

සංවර්ධනය නොකළ ඉඩමවලින් බදු අය කිරීම.

165ඈ. (1) නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ, ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක—

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදි කර නොමැති නම්;

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය, නියමිත අනුපාතයට වඩා අඩු නම්, හෝ

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කැරෙන ගොවිතැනකට ඒ ඉඩම යොදවා නැත්නම්

ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙක කට නොවැඩි ප්‍රමාණයක බද්දක් ඒ සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරුගෙන් වාර්ෂිකව අයකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ඉඩමක භූමියේ ප්‍රාග්ධන තක්සේරු කරන සෑම අවස්ථාවක දී ම, මහ නගර සභා ආඥාපනතේ 235 වන සහ 236 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිත ව, ඊට අදාළ කළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "භූමියේ ප්‍රාග්ධන අගය" යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩමේ ඇති ගොඩනැගිලි සියල්ල අත හැර හා උකස් කර, බදුකර, අවහිර හෝ වෙනත් බැඳීම් සියල්ලෙන් තොර ව ඒ ඉඩම පමණක් විවෘත වෙළෙඳ පොළෙහි දී විකුණනු ලැබුව හොත් ඒ ඉඩම සඳහා ගෙවනු ලැබිය හැකි මිල ගණන ඉන් අදහස් වේ.

ඇතැම් ඉඩම විකිණීම විෂයෙහි බදු අයකිරීම.

165ඈ. (1) නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුව හොත්, ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම විකුණා ලත් මුදලින් ඒ සභාවට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත්වීමෙන් පසු දින දහහතරක් තුළ දී ඒ බද්ද ගෙවනු නො ලැබුව හොත්, ඒ පැහැර හැරීම, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා, ඒ මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"(163 වන වගන්තිය) තුන්වන උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා ... ... | 25 | 00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා— | | |
| (අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 10 | 00 |
| (ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5 | 00 |
| සෑම කරත්තයක් ම සඳහා ... ... | 20 | 00 |
| සෑම අත් කරත්තයක් ම සඳහා ... ... | 10 | 00 |
| සෑම රික්ෂෝවක් ම සඳහා ... ... | 7 | 50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා ... | 15 | 00 |
| සෑම අලියකු ම සඳහා ... ... | 50 | 00 |

රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරක්ක, හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා භාවිත කැරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිත නොකැරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට, යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව, විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද, යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(i) එහි 3 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (ආ) කරුණට ඉක්බිතිව ම පහත දැක්වෙන කරුණ එකතු කිරීමෙන් :—

"(ඉ) බඩු උකස්ගන්නන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර මත බඩු උකස්ගන්නන් වශයෙන් ;"; සහ

(ii) එහි 3 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"4. නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමකට බලපාන පැවරුම්කර, උකස්කර, තෑගිකර සහ බදුකර සම්බන්ධයෙන් මුද්දර ආඥාපනත යටතේ ගෙවනු ලබන සියලු මුද්දර ගාස්තු.".